කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර)-2021

2023 - ඔක්තෝබර්

**BCOME 1015 - කළමනාකරණ මූලධර්ම**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : හතරයි (04) කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්න අංක 01

 අ) "කළමනාකරණය යනු විධිමත් ලෙස සංවිධිත කණ්ඩායම්වල පුද්ගලයන් හරහා සහ එම පුද්ගලයන් ලවා කටයුතු කර ගැනීමේ කලාවයි." ව්‍යාපාර සඳහා කළමනාකරණයේ වැදගත්කම අවධාරණය කරමින් මෙම ප්‍රකාශය කෙටියෙන් විස්තර කරන්න.

**(ලකුණු 07)**

ආ) ටේලර්ගේ විද්‍යාත්මක කළමනාකරණ ප්‍රවේශය පිළිබඳ විවේචන කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 08)**

ඇ) "විශිෂ්ඨ සංස්කෘතියක් මගින් කාර්ය සාධනය වැඩි දියුණු කිරීමට තුඩු දෙන ධනාත්මක ගති ලක්ෂණ විදහා දක්වයි, විශිෂ්ඨ නොවන සංස්කෘතියක් සහිත සමාගම් සාර්ථක සංවිධානවලට පවා බාධා කළ හැකි ගුණාංග ගෙන එයි." විශිෂ්ඨ ආයතනික සංස්කෘතියක ගුණාංග ඉස්මතු කරමින් මෙම ප්‍රකාශය ගැන අදහස් දක්වන්න.

**(ලකුණු 10)**

**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක 02

අ) "සැලසුම් කිරීම යනු අපේක්ෂිත අනාගතයක් සඳහා සැලසුම් කිරීමය." සංවිධානයකට සැලසුම් කිරීමේ ප්‍රතිලාභ ඉස්මතු කරමින් මෙම ප්‍රකාශය කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 07)**

ආ) ආයතනයකට මෙහෙවර ප්‍රකාශයේ ඇති වැදගත්කම උදාහරණයක් සපයමින් පැහැදිලි කරන්න.

**(ලකුණු 08)**

ඇ) ව්‍යාපාර අවස්ථා පිළිබඳ දැනුවත් වීම, සැලසුම්කරණ ක්‍රියාවලියේ පියවරක් නොවුවද, පවතින ව්‍යාපාර අවස්ථා පිළිබඳව මනා දැනුමක් ලබා තිබීම සංවිධානයකට අත්‍යවශ්‍ය වේ. උදාහරණයක් සමඟ සැලසුම්කරණ ක්‍රියාවලියේ පියවර කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 10)**

**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක 03

අ) "නිසි ලෙස සැලසුම් කරන ලද සමතුලිත සංවිධානයක් ව්‍යාපාරයක කළමනාකරණය සහ ක්‍රියාකාරිත්වය යන දෙකටම පහසුකම් සපයයි." මෙම ප්‍රකාශය, සංවිධානකරණයේ වැදගත්කම ඉස්මතු කරමින් පැහැදිලි කරන්න.

**(ලකුණු 07)**

ආ) මධ්‍යගත සහ විමධ්‍යගත සංවිධානවල වාසි සහ අවාසි විස්තර කරන්න.

**(ලකුණු 08)**

ඇ) උදාහරණ සහිතව සංවිධාන සටහන් (Organization charts) වර්ග තුනක් (03) කෙටියෙන් පැහැදිලි කර විස්තර කරන්න.

**(ලකුණු 10)**

**(මුළු ලකුණු 25)**

ප්‍රශ්න අංක 04

අ) "ප්‍රජාතන්ත්‍රවාදී නායකත්වය, ජනතාව වෙනුවෙන් ජනතාව විසින් ජනතාව පාලනය කිරීම ලෙස අර්ථ දැක්විය හැක." ප්‍රජාතන්ත්‍රවාදී නායකත්වයේ සඳහන් වන උපදේශන (Consultative)සහ ඒත්තු ගැන්වීමේ (Persuasive) ශෛලීන් කෙටියෙන් විස්තර කරන්න.

**(ලකුණු 07)**

ආ) උදාහරණයක් සමඟ සංවිධානයක පාලන ක්‍රියාවලිය කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 08)**

ඇ) වර්තමාන සංවිධාන තුළ මැස්ලෝගේ අවශ්‍යතා ධුරාවලියේ (Maslow's hierarchy of needs) අදාළත්වය පැහැදිලි කරන්න.

**(ලකුණු 10)**

**(මුළු ලකුණු 25)**